# සැලසිනේ රූපවාහිනී ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සැලසිනේ රූපවාහිනී ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු හා ගොඩනැගිලි කුලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2011 වර්ෂය තුලදී නොමිලේ පවරා දී තිබුණ කෲ කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේදී රු.1,550,000 කට තක්සේරුකර වත්කම් ගිණුමට ගෙන තිබුණද, එම තක්සේරු අගය ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.මිලියන 20 තැන්පතු සඳහා වූ පොලී අදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට බොල් ණය හා අඩමාණ ණය ගැලපීමට පෙර ණයගැති ශේෂය රු.128,243,987 ක් වුවද, 2012 ජනවාරි 01 දින ණයගැතියන්ගේ ලෙජර ගිණුමට ආරම්භක ශේෂය ලෙස බොල්ණය හා අඩමාණ ණය ගැලපූ වටිනාකම වූ රු.124,962,586 ගෙන තිබුණි. තවද 2012 වර්ෂයේදී අඩමාණ ණය වෙන්කිරීම් ලෙස රු. 6,219,283 අඩමාණ ණය වෙන්කිරීම් ගිණුමක් මගින් නොගලපා බොල් ණය කපාහැරීමක් ලෙස ආදායමට එරෙහිව ගලපා තිබුණි. ණයගැතියන් සඳහා බොල්ණය හා අඩමාණ ණය වෙන්කිරීම වෙනුවෙන් ලෙජර ගිණුම් පවත්වා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 1.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විකුණුම්, විකුණුම් ලෙජරය අනුව රු. 436,802,868 ක් වූ අතර ප්‍රධාන ලෙජරයේ විකුණුම් ගිණුම් අනුව එය රු. 437,939,421 ක් වී තිබුණි. ඒ අනුව විකුණුම් රු. 1,136,553 ක වෙනසක් විය.

(ආ) ණයගැති උපලේඛනය හා ණයගැති ලෙජරය අතර රු.183,230 ක වෙනසක් විය.

(ඇ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද ණයගැති ලෙජරය අනුව කේවල ණයගැතියන්ගේ ආරම්භක ශේෂ වල එකතුව රු. 56,439,633 ක් හා ණයගැති ලෙජර ආරම්භක ශේෂය රු. 128,243,987 ක් බැවින් රු. 71,804,354 ක වෙනසක් විය. 2012 දෙසැම්බර් 31 දිනට ණයගැති උපලේඛනය අනුව එකතුව රු. 9,845,775 ක් වු ණයගැති ශේෂ 20 ක් ණයගැති ලෙජරයේ කේවල ගිණුම්වල දක්වා නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණයගැති උපලේඛනය අනුව ණයගැති ශේෂ 99 නිරීක්ෂණය වුවද, ණයගැති ශේෂ 42 ක් සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි යවා නොතිබුණි.

(ආ) ණයගැති කාලවිශ්ලේෂණය අනුව දින 90 කට වඩා වැඩි ණයගැති ශේෂ වටිනාකම රු. 49,663,465 ක් ව අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 40 ක් විය. තවද එම ණයගැතියන් තුල එකතුව රු. 6,611,743 ක් වූ 2006 වසරට පෙර සිට පැවැත එන ශේෂ විය. ලෙජරයේ වූ එම ශේෂ සඳහා කේවල ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ වෙළඳ ණයහිමියෝ හා දේපල, පිරියත හා උපකරණ, ලැබිය යුතු කොමිස්, ජාතිය ගොඩනැගීමේ බදු පිළිවෙලින් රු. 106,431,355, රු. 17,352,074, රු. 3,528,092, ක් හා රු.10,730,024 සඳහා නිස පරිදි පිළියෙල කළ කාල විශ්ලේෂණ, උපලේඛන, ශේෂ සනාථ ලිපි සහ ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, බදු ලිපිගොනු යනාදි සාක්ෂි නොතිබුණි.

(ආ) 2012 ගිණුම් වර්ෂය තුලදී ජර්නල සටහන් 364 ක් මගින් ගිණුම්වල ගැලපීම් කර තිබුණද, එම ජර්නල සටහන් පරීක්ෂාව සඳහා ජර්නල වවුචර්, අදාල ගණනය කිරීම් හා උපකාරක ලියවිලි යනාදිය විගණනය වෙත ඉදිරිපත් නොකළ බැවින් එම ජර්නල සටහන් මගින් කරන ලද ගැලපීම් වල නිවැරදිතාවය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය.

### 1.2.5 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු. 2,500,000 ක් වූ ස්ථාවර තැන්පතු වල කරන ලද ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) ජේදය | ආයතනයේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේඛනගත ලේඛණගත කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පොදු ආකෘති පත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය හා පොදු ආකෘති පත්‍ර 288 ප්‍රකාර ස්ථාවර වත්කම් ලෙජරය පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,437,942 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 7,539,235 ක් වුයෙන් බදු පූර්ව ලාභයෙහි රු. 13,898,707 ක හෙවත් සියයට 184 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 57,621,784 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබණි.

## 2.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතු වලට අදාල මුදල් ලබාගැනීම සඳහා නඩු දෙකක් හා හිටපු සේවකයින් හතරදෙනෙකු වැඩතහනමට ලක්කිරීම හේතුවෙන් නඩු හතරක් පවරා තිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම රු. 328,075 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන කාර්යයන් 14 කින්ද නිර්මාණශීලී කටයුතු 29 කින්ද උපලේඛනගත කිරීම් 246 කින්ද විශේෂ ව්‍යාපෘති 7 කින්ද වූ වර්ධනය සමස්ත ආදායම 15% කින් ඉහල යාම කෙරෙහි බලපා තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 වර්ෂයේදී එකතු කළ අගය මත බදු සඳහා කාර්තුමය බදු වාර්තා දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා තිබුණද, එයට අදාල මුදල් වටිනාකම වු රු. 18,613,695 දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා ආයතනයේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. එම ගිණුම් ශේෂය ශේෂපත්‍රයේ මුදල් හා මුදල් සමාන විෂයයන් යටතේ දක්වා තිබුණි.

### 3.3 කාර්යමණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 27 ක් වුවද, 48 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් වු අතර එහි ස්ථිර 15 දෙනෙකු හා තාවකාලික 33 දෙනෙකු සේවයේ යොදවා තිබුණී.

### 3.4 වාහන උපයෝජනය

ආයතනය විසින් කුලී පදනම මත වාහන ලබාගැනීමේදී 2003 මාර්තු 28 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ එම්එෆ්/ටිආර්/01/2003 ලිපිය ප්‍රකාරව වාහන කුලියට ලබාගත හැකි උපරිම වටිනාකම රු.40,000 ක් වුවත්, ඊට පටහැනිව මාසික කුලිය රු. 65,000 සහ රු. 45,000 ක් ගෙවීමේ පදනම මත වාහන දෙකක් ලබා ගෙන තිබුණි. 2012 වර්ෂය තුල ඒ සඳහා වැය කළ වියදම රු. 1,185,000 ක් වී තිබුණි. මෙම වාහන කුලී පදනම මත ලබාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද, සැලසනේ රූපවාහිනී ආයතනය විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2013 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

2011-2013 කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්මෙහි 2012 හි කළයුතු කාර්යයන් වශයෙන් රූපවාහිනී නාලිකාවක පැයක පමණ ගුවන් කාලයක් වෙන්කර ඒ සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් පෙන්වීමට කටයුතු කිරීම, මහින්ද චින්තන වැඩසටහන යටතේ අවසන් කර ඇති ව්‍යාපෘතීන් පිළිබඳ රූපවාහිනී වැඩසටහන් තරඟාවලියක් පැවැත්වීම හඳුනාගෙන තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

### 4.3 අයවැය පාලනය

2012 වර්ෂයේ අයවැය ලේඛනයක් සකස කිරීමේදී එක් එක් වැඩසටහන් සඳහා අයවැයගත ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන විධිමත්ව සකස් කර නොතිබුණි.

### 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.5 අධ්‍යක්ෂ මණ්ඩලය

2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණයගැතියන්

(ආ) බදු ගෙවීම

(ඇ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම

(ඈ) ගිණුම්කරණය